06

චරිතායන අධ්‍යාපනය සඳහා ඉතිහාසය විෂයෙහි භාවිතය

අයි.ඩී.දිදුමිණී සත්සරණී

අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

සාරසංක්ෂේපය

අධ්‍යාපනයේ මූලික පරමාර්ථය වන්නේ පූර්ණ පෞරුෂයකින් හෙබි පුද්ගලයෙකු නිර්මාණය කිරීම යි. ඒ සඳහා ප්‍රජානන, ආවේදන හා මනෝචාලක යන ක්ෂේත්‍ර තුනෙහි ම සංවර්ධනය අත්‍යවශ්‍ය වේ. ඒ අතර ආවේදන ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා ඒ යටතේ එන චරිතායන අධ්‍යාපනය බෙහෙවින් ඉවහල් වන්නකි. එහි දී සමාජ විද්‍යා විෂයන් සම්බන්ධ වන අතර ඉතිහාසය විෂය ද ඒ අතරට එක් වේ. වත්මන් විභාග කේන්ද්‍රීය හා දැඩි තරඟකාරී අධ්‍යාපන රටාව තුළ සිසුන් ඉතිහාසය විෂය දකිනුයේ කටපාඩම් විෂයක් ලෙසිනි. එවැනි තත්ත්වයක් තුළ ඉතිහාසය විෂයෙන් චරිත සංවර්ධනය සිදුවන්නේ ද යන්න ප්‍රශ්නාර්ථයක් මතු වේ. එම නිසා චරිත සංවර්ධනය සඳහා ඉතිහාසය විෂය භාවිත කළ යුතු වන්නේ කෙසේ ද යන්න විමසා බැලිය යුතු ය. මෙම ලිපියේ දී ඉතිහාසය විෂය අරමුණු චරිත සංවර්ධනයට සම්බන්ධ වන ආකාරය, ඒ සඳහා ඉගෙනුම් ක්‍රම ශිල්ප යොදාගන්නා ආකාරය, චරිත සංවර්ධනය සිදු වී ඇති දැයි මැන බැලීමට යොදාගත හැකි තක්සේරුකරණ ක්‍රමවේද හඳුනා ගැනීම යන ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමු කරයි.

මුඛ්‍ය පද:

ඉතිහාසය විෂයය, චරිත සංවර්ධනය, චරිතායන අධ්‍යාපනය

හැඳින්වීම

වර්තමානයේ දක්නට ලැබෙන්නේ තාක්ෂණය මුල් කර ගත් තරඟකාරී සමාජයකි. එහි සිසුන් ද යන්ත්‍ර මෙන් ක්‍රියා කරන බැවින් ඔවුන් සිය ආකල්ප හෝ චරිත සංවර්ධනයට ලබා දෙන්නේ අඩු වැදගත්කමකි. එහෙත් ලෝක ප්‍රකට චින්තකයන් පවා පෙන්වා දී ඇත්තේ දැනුමින් පමණක් නිසි අධ්‍යාපනයක් නො ලැබෙන බව යි. “සත්‍ය අධ්‍යාපනයේ මූලික පරමාර්ථය දැනුම හා චරිතවත් බව යන දෙක ම ඇති කර ගැනීම යි” යනුවෙන් මාර්ටින් ලුතර් කිං පෙන්වා දී ඇත. මහත්මා ගාන්ධිතුමා පවසා ඇත්තේ චරිතවත් බව ඇති කර ගෙන නැතිනම් සාක්ෂරතා අධ්‍යාපනයෙන් පලක් නැති බව යි. මේ අනුව පැහැදිලි වන්නේ චරිතායන අධ්‍යාපනයේ ඇති වටිනාකම යි. අවශ්‍යතාව යි. මේ වෙනුවෙන් ස්වාභාවික විද්‍යා විෂයන්ට වඩා ශිෂ්‍යයාට සමීප වන්නේ සමාජ විද්‍යා විෂයන් ය. ඒ අතර මෙරට පාසල් විෂයමාලාවේ සමාජ විද්‍යා විෂයක් ලෙස ඉතිහාසය විෂය අන්තර්ගත වේ. පිරිවෙන් අධ්‍යාපනය ලබා දෙන යුගයේ සිට ම ඉතිහාසය විෂය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියට ඇතුළත් කර තිබේ. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල දී සමාජ අධ්‍යයන විෂය යටතේ උගන්වන ලද මෙම විෂයය 2007 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් ස්වාධීන විෂයක් ලෙස පාසල් විෂයමාලාවට ඇතුළත් විය. එතැන් පටන් හය ශ්‍රේණියේ සිට

එකොළහ ශ්‍රේණිය දක්වා විෂයමාලාවේ හර විෂයක් ලෙස හෙවත් අනිවාර්යය විෂයක් ලෙස උගන්වයි. තව ද උසස් පෙළ කලා විෂය ධාරාව යටතේ ද හැදෑරිය හැකි විෂයක් බවට මෙය පත් වී තිබේ. 1997 සිට ක්‍රියාත්මක වන විෂයමාලාවේ ද සාරධර්ම හා සදාචාරය වෙන ම විෂයක් ලෙස ඉගැන්වීමට නො හැකි නිසා පාසලේ උගන්වන සියලු ම විෂයන් සමඟ සමෝධානිත කළ යුතු යැයි යෝජනා කර ඇත. ඒ අනුව පෙනීයන්නේ ඉතිහාසය විෂයය තුළින් ද චරිතායන අධ්‍යාපනය සඳහා දායකත්වයක් ලබා දිය යුතු බව යි.

ලංකාවේ චරිතායන අධ්‍යාපනය සඳහා ඉතිහාසය විෂය ඉවහල් වන බව සනාථ වන ප්‍රධාන ම අවස්ථාව වන්නේ ඉතිහාසය විෂයෙන් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු ය. එම අරමුණු අතර එක් අරමුණක් වන්නේ වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම යි. එම අරමුණෙන් බලාපොරොත්තු වන්නේ අතීතයේ ජීවත් වූ වැදගත් පුද්ගලයන්ගේ චරිත ලක්ෂණ සිසුන්ට හඳුන්වා දී එම චරිත ලක්ෂණ තම ජීවිතයට සම්බන්ධ කරගෙන ඒ ඇසුරින් තම ජීවිතය සාර්ථක කර ගැනීම යි. දුටුගැමුණු, මහා විජයබාහු, මහා පරාක්‍රමබාහු වැනි රජවරු, වීර පුරන් අප්පු, ගොංගාලේ ගොඩබණ්ඩා, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, ආරුමුග නාවලර්තුමා, සිද්ධි ලෙබ්බේතුමා ඩී.එස්.සේනානායක, එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මැතිතුමා වැනි අතීතයේ පටන් මෙරට ඉතිහාසයේ වැදගත් චරිතවල චරිත ලක්ෂණ වර්තමාන ඉතිහාසය විෂයමාලාවට එකතු කර ඇත. ඔවුන්ගේ උත්සාහය, කැපවීම, අධිෂ්ඨානය ආදි වූ පෞරුෂත්ව ගුණාංග එකී චරිතාපදාන ඇසුරින් සිසුන්ට සමීප කරවමින් ඒ ලක්ෂණ සිසුන් තුළ වර්ධනයට උත්සාහ කරයි.

දේශීය වශයෙන් වැදගත් වන චරිතාපදාන පමණක් නො ව විදේශීය චරිතාපදාන පිළිබඳ ව ද ඉතිහාසය විෂයමාලාවේ සඳහන් වේ. නිදසුනක් ලෙස 09 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොතෙහි ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය හා එහි නායකයන් ගැන දැක් වේ. ඔවුන්ගේ චරිත ලක්ෂණ ද තම ජීවිතයට එකතු කරගෙන සිසුන්ට සිය ජීවිත සාර්ථක කර ගැනීමේ හැකියාව පවතී. මේ නිසා ඉතිහාසය විෂය සිසුන්ගේ චරිත සංවර්ධනයට දායක කරගත හැකි වන බව පෙන්වා දිය හැකි ය.

ඉතිහාසය විෂයේ තවත් විෂය අරමුණක් වන්නේ අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට හුරු කිරීම යි. ලංකා ඉතිහාසය පමණක් නො ව අසල්වැසි ඉන්දියාවේ ඉතිහාසය, යුරෝපා ඉතිහාසය මෙන් ම ලෝක ඉතිහාසයට ද අදාළ සිදුවීම්, පුද්ගලයන් පිළිබඳ ව ඉතිහාසය විෂයමාලාවේ අන්තර්ගත වේ. එවිට සිසුන්ට ලෝකයේ විවිධ සංස්කෘතීන්, ඒ හා බැඳුණු සිරිත් විරිත්, චාරිත්‍ර මෙන් ම ඒ ඒ සංස්කෘතීන්ට අයත් පුද්ගලයන්ගේ ස්වභාවයන්, අත්දැකීම් ආදිය පිළිබඳ අවබෝධය ලැබේ. එය ඔවුන්ට සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගැනීමටත් තමා අයත් වන සංස්කෘතියට මෙන් ම ලෝකයේ පවතින අනෙකුත් සංස්කෘතීන්ට ගරු කිරීමටත් හැකියාව ලබා දේ. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම යනු පුද්ගල චරිතයේ ඉහළ ගුණාංගයකි. එසේ සංස්කෘතීන්ට ගරු කිරීමට හුරු වීම නිසා ඒ ඒ සංස්කෘතීන් අතර ඇති වීමට ඉඩ ඇති ගැටුම් වළක්වා ගත හැකි ය. සියලු සංස්කෘතීන් සමඟ සාමකාමී ලෙස ජීවත් වීමට පුද්ගලයා හුරුවක් ලබයි. යුනෙස්කෝ සංවිධානයට අනුව යුද්ධ හට ගන්නේ මිනිස් සිත් තුළ ය. සාමයේ පවුරු පදනම් ගොඩ නැගිය යුත්තේ ද මිනිස් හදවත් තුළ ය. මේ සඳහා හොඳ ම විෂය ඉතිහාසය යි. ඒ අනුව පැහැදිලි වන්නේ එකිනෙකා අතර ගැටුම්, අර්බුද ඇති කර නො ගෙන සාමකාමී ලෙස ජීවත් වීමේ යහපත් චරිත ලක්ෂණය පුද්ගලයා තුළ සංවර්ධනය කරගැනීමට ඉතිහාසය විෂය ඉවහල් වන බව යි.

ජාතික අනන්‍යතාව හඳුනා ගෙන දේශීය උරුමය සුරකිමින් දෑ හිතකාමී පුරවැසියෙකු බවට පත් වීම ඉතිහාසය විෂයයේ විෂය අරමුණු අතරට එක් වන තවත් අරමුණකි. තම රට, ජාතිය, ආගමට ගරු කිරීම, ඒ පිළිබඳ හැඟීමකින් කටයුතු කිරීම, ඒ පිළිබඳ අභිමානයෙන් සිතීම, එය ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම වැනි ගුණාංග පුද්ගලයා තුළ ඇති කිරීමට ද ඉතිහාසය විෂය අවශ්‍ය වේ. ඉන් සනාථ වන්නේ ඉතිහාසය විෂය සිසුවාගේ චරිත සංවර්ධනයට අත්‍යවශ්‍ය විෂයක් බව යි.

චරිතායන අධ්‍යාපනය සඳහා ඉවහල් වන අරමුණු ඉතිහාසය විෂයේ විෂය අරමුණු ලෙස පැවතීම පමණක් ඒවා ඉටු කර ගැනීමට ප්‍රමාණවත් නැත. අරමුණක් ඉටු ක රගැනීමට නම් එම අරමුණ පිළිබඳ දැනුවත් වී සිටීම අවශ්‍ය වේ. ඉතිහාසය විෂයේ විෂය අරමුණුවල සිසුන්ගේ චරිත සංවර්ධනය ඉලක්ක කර තිබුණ ද එකී අරමුණු පිළිබඳ සිසුන් හා ගුරුවරුන් දැනුවත් නැති නම් එම අරමුණු ඉටු වීමේ සම්භාවිතාවය අවම වේ. එම නිසා පළමු ව ඉතිහාසය විෂය උගන්වන ගුරුවරයා ඉතිහාසය විෂය අරමුණු පිළිබඳ දැනුවත් වී පසුව සිසුන් ව ද ඒ පිළිබඳ දැනුවත් කළ යුතු ය. නිදසුනක් ලෙස ඉතිහාසය විෂයේ දී සිසුහු නොයෙක් චරිතාපදාන ඉගෙන ගනිති. එහෙත් අතීතයේ සිටි එම චරිත පිළිබඳ ඉගෙනීම වර්තමානයේ සිටින තමාට ප්‍රයෝජනවත් නො වේ යැයි ඇතැම් විට සිසුන් සිතීමට පුළුවන. එම නිසා ගුරුවරයා පාඩමට පෙර චරිතාපදාන පිළිබඳ ඉගෙනීමෙන් සිසුන්ට එම චරිතාපදානවල චරිත ලක්ෂණ චරිතායනය කර ගෙන සිය ජීවිත සාර්ථක කරගැනීමට හැකියාව ලැබෙන බව පැවසිය යුතු ය. එනම් චරිතාපදාන පිළිබඳ ඉගෙනීමේ අරමුණ සිසුන්ට පැහැදිලි කර දීම යි. එවිට සිසුන් තමා තුළ ද එම චරිත ලක්ෂණ ඇති කර ගැනීමට පෙළඹීමක් ලබ යි. එය ඔවුන්ගේ චරිත සංවර්ධනයට හේතු වේ.

චරිත සංවර්ධනය ආවේදන ක්ෂේත්‍රය සමඟ සම්බන්ධ වන්නකි. ඒ නිසා ඉතිහාසය විෂයය උගන්වන ගුරුවරයා තම පාඩම් සැලසුමේ ආවේදන ක්ෂේත්‍රයට අදාළ සුවිශේෂී අරමුණු ලෙස ඉතිහාසය පාඩමට අදාළ ව සිසුවාගේ චරිත සංවර්ධනය සිදු වන අරමුණු දක්වා ඒවා ක්‍රියාවට නැංවිය යුතු ය. ඉතිහාසය විෂයමාලාව තුළ චරිත සංවර්ධනය සඳහා ඍජුව ම පාඩම් තුළ නොතිබිය හැකි ය. එහෙත් සමස්ත විෂය අරමුණුවලින් සිසුවාගේ චරිත සංවර්ධනය ඉලක්ක කර ගනියි. ඒ නිසා ගුරුවරයා ඒ පිළිබඳව ද අවධානය යොමු කරමින් සිය පාඩම් සැලසුම් සකස් කළ යුතු ය. විශේෂයෙන් විෂය අරමුණු ක්‍රියාවට නංවන්නේ ගුරුවරයා වන බැවින් ඉතිහාසය විෂය චරිත සංවර්ධනයට යොදාගැනීමට ගුරුවරයා සිය පාඩම් සැලසුම ඊට ගැළපෙන ආකාරයෙන් සකස් කරගැනීම අත්‍යවශ්‍ය වේ.එසේ ම එම සැලසුම වඩාත් ශිෂ්‍ය කේන්ද්‍රීය වන ආකාරයෙන් සකස් වන්නේනම් උචිත ය.

ප්‍රාථමික අවධියේ පටන් ම සිසුන්ට ඉතිහාසය විෂය පාසල්වල උගන්වයි. ඉතිහාසය යනුවෙන් වෙන ම විෂයයක් ලෙස නො තිබුණ ද සිංහල හා බුද්ධ ධර්මය යන විෂය හරහා ඉතිහාසය විෂය කරුණු ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ට ඉගැන්වීම සිදු වේ. ජීන් පියාජේගේ බුද්ධි සංවර්ධන න්‍යායට අනුව මෙම මට්ටමේ දී සිසුන් අයත් වන්නේ සංයුක්ත ක්‍රියාකාරී චින්තන අවධියට ය. එම නිසා ගැඹුරු සංකල්ප පිළිබඳ වටහා ගැනීමේ හැකියාවක් ලැබෙන්නේ නැත. එහෙත් කතාන්දර ආකාරයෙන් ඉතිහාස සිදුවීම්, චරිත පිළිබඳ සිසුන්ට ඉදිරිපත් කිරීමේ හැකියාව ගුරුවරයාට පවතී. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුහු කතාන්දර ඇසීමට ප්‍රිය කරති. පණ්ඩුකාභය, දුටුගැමුණු, විහාර මහා දේවිය වැනි ශ්‍රේෂ්ඨ චරිතවල කතාන්දර ඉතා විචිත්‍රවත් සිත් ඇදගන්නා සුළු ආකාරයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව පවති. එවිට සිසුහු ඒ කෙරෙහි ආකර්ෂණය වෙති. ඒ නිසා ම ඒ චරිතවල ඇති චරිත ලක්ෂණ

තමා තුළ ද ඇති කර ගැනීමට සිසුන් තුළ පෙළඹවීමක් ඇති වේ. එසේ ම දේශීය අනන්‍යතාව පිළිඹිබු වන සිද්ධීන් පිළිබඳ ගොඩනැගුණු කතාන්දර ද සිසුන්ට ඉදිරිපත් කළ හැකි ය. දේශීය උරුමය සහ එහි වටිනාකම පිළිබඳ කුඩා කළ සිට ම අවබෝධයක් එමගින් ඇති කරයි. එය එම උරුමයට ගරු කිරීමට, රැකගැනීමට පෙළඹෙන සිතුවිලි ඇති කර ගැනීමට පදනමක් සපයයි.

පියාජේගේ බුද්ධි සංවර්ධන අවධිවලට අනුව කණිෂ්ඨ ද්විතියික හා ජ්‍යෙෂ්ඨ ද්විතියික අවධි වන විට සිසුහු වියුක්ත ක්‍රියාකාරී චින්තන අවධියට අයත් වෙති. එබැවින් මේ අවධියේ දී කතාන්දර කීම වැනි ක්‍රමවේද භාවිත කිරීම සුදුසු වන්නේ නැත. මෙම අවධියේ සිසුන්ට ඒ ඒ පුද්ගලන්ගේ චරිත ලක්ෂණ පෙන්වා දීම පමණක් නො ව එම චරිත ලක්ෂණ තමාගේ ජීවිතය තුළ භාවිතයට ගත හැකි අවස්ථා පෙන්වා දීම මෙහි දී සිදු කළ යුතු ය. දුටුගැමුණු, විජයබාහු වැනි රජවරුන්ගේ චරිත ලක්ෂණ පන්ති නායකයෙකු ශිෂ්‍ය නායකයෙකු වශයෙන් සිසුවාට භාවිතයට ගත හැකි අවස්ථා ගැන පැහැදිලි කර දීම ගුරුවරයාට කළ හැකි ය. අතීත රජවරුන්, නායකයන් සතු ව පැවති ඉවසීම, මෘදු ගුණය, පක්ෂපාතීත්වය ආදී වූ ගුණාංග සාමාන්‍ය ජීවිතයට සම්බන්ධ කරගත හැකි අවස්ථා නිදසුන් ලෙස ගෙන හැර දක්වමින් සිසුන්ට ඉදිරිපත් කිරීම වැදගත් වේ.

තව ද දේශීය උරුමය පිළිඹිබු වන ස්ථාන නැරඹීමට ක්ෂේත්‍ර චාරිකා යාම, එවන් ස්ථානවල උරුමයේ වටිනාකම පැහැදිලි කර දී ඒවා ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පෙන්වා දීම, අන්‍ය සංස්කෘතිකාංග ඇතුළත් වීඩියෝපට ආදිය පෙන්වා දෙමින් එම සංස්කෘතික විවිධත්වය අවබෝධ කර දී එම සංස්කෘතීන්ට ගරු කළ යුතු බව ඒත්තු ගැන්වීම ආදිය ද සිසුන්ගේ චරිතායන අධ්‍යාපනය සඳහා ඉතිහාසය ගුරුවරුන්ට ගත හැකි තවත් ක්‍රියාමාර්ග ලෙස ඉදිරිපත් කළ හැකි ය. එසේ ම සී.එස්.සේනානායක, අනගාරික ධර්මපාල වැනි අතීත වැදගත් ඓතිහාසික චරිත සජීවී ව දැක්වෙන වීඩියෝපට, ඔවුන්ගේ චරිත අළලා සකස් කර ඇති චිත්‍රපට ආදී ශ්‍රව්‍ය දෘශ්‍ය ඉගෙනුම් ආධාරක යොදාගනිමින් සිසුන්ට සිය චරිත සංවර්ධනය සඳහා වඩාත් ක්‍රියාකාරී අත්දැකීම් ලබා දීමට වර්තමාන තාක්ෂණික දියුණුව නිසා හැකියාව පවති.

චරිතායන අධ්‍යාපනය ඇති කරලීම වෙනුවෙන් ඉතිහාසය විෂය සම්බන්ධ යම් යම් තක්සේරුකරණ ක්‍රම ද යොදා ගත හැකි ය. ඉතිහාසය විෂය ආශ්‍රිත සුතථ්‍ය තක්සේරුවක් නිර්මාණය කිරීමෙන් සිසුවාට එම විෂයෙන් ඔහුගේ චරිත සංවර්ධනය වී ඇති දැයි යම් මට්ටමකට මැනීමේ හැකියාව පවතී. සැබෑ ලෝකයේ ගැටලුකාරී අවස්ථාවක් ලබා දී එම ගැටලුව විසඳීමට අතීත රජකෙනෙකුගේ හෝ වෙනත් වැදගත් නායකයෙකුගේ චරිතය ඇසුරු කරගන්නා ආකාරය ලිඛිත ව හෝ වාචික ව සඳහන් කිරීමෙන් සිසුවා ඇගයීමට ලක් කිරීමට අවස්ථාව තිබේ. එසේ ම යම්කිසි කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලබා දී එයට සිසුන් සහභාගීත්වය දක්වන ආකාරය නිරීක්ෂණය කිරීමෙන් ඉවසීම, එකිනෙකාගේ අදහස්වලට ගරු කිරීම, එකිනෙකාට ආචාර කිරීම, සාමය පවත්වාගෙන යාම වැනි චරිත ලක්ෂණ ඔවුන් සිය ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කරගන්නේ දැයි ඇගයීමට ලක් කිරීමේ හැකියාව පවති. ඓතිහාසික ස්ථාන ආරක්ෂා කර ගැනීම වැනි මාතෘකාවක් ලබා දී ඒ ඇසුරින් රචනාවක්, බිත්ති පුවත්පත් ලිපියක් වැනි නිර්මාණයක් සිදු කිරීමට ද සිසුන්ට අවස්ථාව ලබා දිය හැකි ය. ඒ ඇසුරින් ද තම උරුමයන් රැකගැනීමේ අවශ්‍යතාව ඔවුන් තුළ කෙතරම් දුරට පවතී ද යන්න මැනිය හැකි ය. කෙසේ වුව ද

චරිතායන අධ්‍යාපනය ආවේදන ක්ෂේත්‍රය හා සම්බන්ධ වන නිසා ඇගයීම් මඟින් සිසුවාගේ චරිත සංවර්ධනය ඉහළ ම සංගතතාවකින් මැන ගැනීම අසීරු බව ද මෙහි දී සඳහන් කළ යුතු ය.

එසේ ම මෙම තක්සේරුව ලකුණු ප්‍රදානය කිරීම අරමුණු කරගැනීමකින් තොර ව සිදු කිරීම වඩා වැදගත් වේ. මන්ද මෙහි දී සිදු වන්නේ සිසුන්ගේ ආවේදන සංවර්ධනයකි. එම නිසා ලකුණු මත සිසුවාගේ සැබෑ ආවේදනය තීරණය කිරීම අසීරු වේ. තරඟකාරී අධ්‍යාපනය තුළ මේ සඳහා ලකුණු පැවරීමක් සිදු කළහොත් එදිනට මැනිය හැකිවන්නේ සිසුන්ගේ සැබෑ චරිතය නොවේ. ලකුණු වෙනුවෙන් ආරෝපණය කරගත් චරිතයක් විය හැකි ය. ලකුණු ලද පසු එම චරිත ලක්ෂණය සිසුවා තමා තුළින් ඉවත් කර දැමීමට වුව පෙළඹිය හැකි ය. මේ නිසා ලකුණු පවරා දෙන තක්සේරුව මෙහි දී නො ගැළපේ. මෙහි දී ගුරුවරයාට නිරීක්ෂණය මඟින් සිසුවා තක්සේරුවට ලක් කිරීමේ අවස්ථාව ඇත. එම නිරීක්ෂණයන් ඔස්සේ සිසුවාට ඉදිරි පෝෂණ හෝ ප්‍රතිපෝෂණ ලබා දීමට හැකි ය. එසේ ම ධන හා ඍණ උපස්ථම්භන ද සිසුන්ගේ චරිතායන අධ්‍යාපනයේ දී ගුරුවරයා හැකි තරම් භාවිත කළ යුතු ය.

විශේෂයෙන් ඉතිහාසය විෂයය මගින් පුද්ගලයා තුළ චරිත සංවර්ධනය සිදු වන ආකාරය පිළිබඳ අධ්‍යනය කිරීමට පර්යේෂණ පවා සිදු කර තිබේ. එහි දී ද්විතියික පාසල්වල ඉතිහාසය ඉගැන්වීමේ දී සදාචාර අධ්‍යාපනයේ කාර්යයභාරය යනුවෙන් එංගලන්තයේ Durham විශ්වවිද්‍යාලයේ පර්යේෂණයක් ද සිදු කර තිබේ. එහි සඳහන් වන පරිදි ඓතිහාසික චරිත සදාචාරාත්මක ආකෘති ලෙස ක්‍රියා කරයි. (McNeil,1993) 2019 වර්ෂයේ Tas & Minaz විසින් 04 වන ශ්‍රේණියේ ප්‍රාථමික පාසල් සිසුන්ගේ ඉවසීමේ ආකල්ප කෙරෙහි චරිතාපදාන පාදක සාරධර්ම අධ්‍යාපනයේ බලපෑම යනුවෙන් පර්යේෂණයක් සිදු කර තිබේ. එහි දී සිසුන් තුළ ඉවසීම ඇති කිරීමට චරිතාපදාන පාදක වන බව තහවුරු කරගෙන තිබේ. (Tas & Minaz,2019) ඉතිහාසය විෂයේ දී ද චරිතාපදාන පිළිබඳ ඉගැන්වීම සිදු වන නිසා සිසුන්ගේ චරිතායන අධ්‍යාපනය සඳහා ඉතිහාසය විෂය වෙසෙසින් දායක වන බව මේ අනුව පෙන්වා දිය හැකි ය.

නිගමනය

ඉතිහාසය යනු සිදු වී අවසන් වූවකි. එය සිදු වී අවසන් වූ පමණින් එය ඉවත් කර හෝ අමතක කර හෝ දැමිය නො හැකි ය. ඉතිහාසයෙන් ගත යුතු දෑ වර්තමානය හා අනාගතය වෙනුවෙන් ලබා ගත යුතු ය. අතීත චරිතාපදාන, සිදුවීම්, නටඹුන් ආදිය ඇසුරින් පුද්ගලයාගේ චරිත සංවර්ධනය සඳහා ලබාගත හැකි දායකත්වය ලබා ගන්නේ එබැවිනි. පාසල් සිසුන්ගේ චරිත සංවර්ධනය කිරීම වෙනුවෙන් ඉතිහාසය විෂයමාලාවේ අන්තර්ගතය මෙන් ම ඉතිහාසය ගුරුවරයාගේ දායකත්වය ද අවශ්‍ය වේ. එනම් ගැළපෙන ඉගැන්වීම් ක්‍රමවේද හා තක්සේරුකරණ ක්‍රම යොදා ගැනීමයි. තාක්ෂණික දියුණුවත් සමඟ ඉතිහාසය වැනි සමාජ විද්‍යා විෂයන් කෙරෙහි සමාජයේ ඇති නැඹුරුව ඉතා අවම වේ. එවන් යුගයක ඉතිහාසය විෂයයෙන් චරිත සංවර්ධනයට ඇති හැකියාව තේරුම් ගෙන සිසුන්ගේ චරිතායනයට එම විෂය ඵලදායී ලෙස යොදා ගනිමින් චරිතවත් සිසු පිරිසක් දායාද කිරීම අනාගත ආයෝජනයකි.

ආශ්‍රිත ග්‍රන්ථ

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. (2018). *ඉතිහාසය: 09 ශ්‍රේණිය*. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ජයතිලක, ඩී. ආර්. එම්. එච්. කේ. (2009). *ශ්‍රී ලංකාවේ විධිමත් පාසල්හි ඉතිහාසය විෂයේ අපේක්ෂණ හා තෝරාගෙන ඇති විෂය අන්තර්ගතයේ ක්‍රියාකාරීත්වය අතර සම්බන්ධතාව පිළිබඳ අධ්‍යයනයක්* [අප්‍රකාශිත අධ්‍යාපනපති නිබන්ධනය]. කොළඹ විශ්වවිද්‍යාලය.

රත්නායක, වී. (1994). *ඉතිහාසය ඉගැන්වීම*. ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්.

Gandhi on value education. (n.d.). Gandhi Heritage Portal / Articles on and by Mahatma Gandhi. https://www.mkgandhi.org/articles/value_edn.php

McNeil, K. (1993). *The role of moral education in the teaching of history in secondary schools* [Master's thesis, University of Lincoln]. Academia.edu. https://www.academia.edu/89462306/The_role_of_moral_education_in_the_teaching_of_history_in_secondary_schools

The Martin Luther King, Jr. Research and Education Institute. (n.d.). *The purpose of education*. Stanford University. https://kinginstitute.stanford.edu/king-papers/documents/purpose-education